# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2038/28 – 2017 සැප්තැම්බර් 28 වැනි බ්‍රහස්පතින්දා – 2017.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස – ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 228 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2014/ඩබ්ලිව්එස්/139.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
කේඩීඑස්/ඩීඕඑල්/4/4/5/3/18.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, දොළුව.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර පහල කෝරළේ සුළු කොට්ඨාසයේ, මැදපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/ඩීඕඑල්/2015/60 හා 2015.06.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඔරුවකෙටූ තැන්න හේන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0665 ක් පමණ**

උතුරට: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත, හිමිකම් කියන අය නොදන්නා ලියෝවත්ත සහ කොක්කා ඔය; නැගෙනහිරට: කොක්කා ඔය සහ අගල; දකුණට: අගල සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත.

10 - 337

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2017 අංක 235 දරන ආඥාව**

මගේ යොමු අංකය: 03ජේ/87/එල්ජී/221.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
කේඕටී/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/01/27.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, කොටපොල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, කොටපොල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 45 අතිරේක අංක 51 පත්‍ර අංක 78 හා 1984.12.12 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1918 – තලවත්තගෙයි ඉහළ වත්ත සහ මුරුතවිල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.114**
උතුරට: මාර්ගය (මහාමාර්ග) සහ කැබලි අංක $417^{A}$; නැගෙනහිරට: කැබලි අංක $417^{A}$ සහ 516; දකුණට: කැබලි අංක $417^{A}$, 516 සහ මාර්ගය (මහාමාර්ග); බටහිරට: කැබලි අංක 516 සහ මාර්ගය (මහාමාර්ග).

10 - 338

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2014 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1882/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි(460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 266 දරන ආඥාවේ සඳහන් කැබලි අංක 01, 02, 03, 04, 05 සහ 06 ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ යොමු අංකය: 4-3/12/2014/සීර්බී/21.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:ඩීඑස්ඕ/එච්ඕඑම්/එල්ඒසී/87(11).
2017 අගෝස්තු මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, 450, බටවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බටවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මු.පි.කො. 9532 හා 2015.04.29 දිනැති මූලික පිඹුරේ හෙක්. 0.158 ක් වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අංක 01 – දවටගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.1085**
උතුරට: කැබලි අංක 2 සහ මාර්ග (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා) සහ සූරියආරච්චිගේ චන්ද්‍රලතා හිමිකම් කියන දවටගහලන්ද; දකුණට: සූරියආරච්චිගේ චන්ද්‍රලතා හිමිකම් කියන දවටගහලන්ද, ලියන ආරච්චිගේ නන්දසිරි හිමිකම් කියන දවටගහලන්ද, කැබලි අංක 8 සහ 5; බටහිරට: කැබලි අංක 8, 5 සහ 2.

02. **කැබලි අංක 07 – දවටගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0495**
උතුරට: කැබලි අංක 5, 2 සහ 1; නැගෙනහිරට: කැබලි අංක 1, සූරියආරච්චිගේ චන්ද්‍රලතා හිමිකම් කියන දවටගහලන්ද, ලියන ආරච්චිගේ නන්දසිරි හිමිකම් කියන දවටගහලන්ද සහ පාර; දකුණට: ලියන ආරච්චිගේ නන්දසිරි හිමිකම් කියන දවටගහලන්ද සහ පාර; බටහිරට: කැබලි අංක 7, 5 සහ 2.

10 - 339

---

ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2017 අංක 150 දරන ආඥාව**

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) ආඥාව යටතේ අංක 2026/37 හා 2017.07.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 2A පිටුවේ පළ කරන ලද 2017 අංක 150 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ සඳහන් ඉඩමේ නම " මාගොල්ලතැන්නේ කුඹුර" යන්න වෙනුවට " වාගොල්ලතැන්නේ කුඹුර" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/92/ඩබ්ලිව්එස්/39.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/4/2/ඩබ්ලිව්/19/II.
2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.